සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College Kandana 38588 2025-01

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂය / பாடம் / Subject | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .............................................. විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50 ක් හිමිවන අතර ඉතිරි ලකුණු 50 වර්ෂය තුළ සිදු කරන ලද පාසල් පාදක ඇගයීම මත ලබා දෙනු ඇත. සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100කි.
- ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස ලෙස කොටස් දෙකකින් සමන්විත ය.
- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලටත් දෙවන කොටසින් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ගෙවතු වගාව සඳහා යොදා ගනු ලබන කෙටි කාලීන වැල් බෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. දඹල, වැල් දොඩම් හා සාරණ
    2. කරවිල, පතෝල හා වැටකොළු
    3. වැටකොළු, දඹල හා තම්පලා
    4. මෑ, බෝංචි හා නිවිති

02. වර්ෂයේ එක් නිශ්චිත කාලයකට පමණක් අස්වනු ලැබෙන පලතුරු වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න
    1. කෙසෙල්, අඹ හා ලොවි
    2. පේර, අන්නාසි හා මිදි
    3. දූරියන්, මැංගුස් හා රඹුටන්
    4. දිවුල්, පේර හා කෙසෙල්

03. ගෙවත්තෙන් නිෂ්පාදනය කළ හැකි අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස සැලකිය හැක්කේ,
    1. බිම්මල් නිෂ්පාදනය කර අලෙවි කිරීම.
    2. පලා වර්ග වගාකර මිටි බැඳ අලෙවි කිරීම.
    3. බීජ නිෂ්පාදනය කර අලෙවි කිරීම.
    4. මුං හා කව්පි බීජ මුල් අද්දවා ඇසුරුම් කර අලෙවි කිරීම.

04. නිවසේ අලංකරණයට යොදා ගත හැකි ලෙස ශාකවල මූල මණ්ඩල මැදි කොට බෝලයක් සේ සැකසීම හඳුන්වනුයේ,
    1. බොන්සායි කලාව ලෙසිනි.
    2. කොකිඩාමා කලාව ලෙසිනි.
    3. තොරිදෝකෝ කලාව ලෙසිනි.
    4. ඔරිගාමී කලාව ලෙසිනි.

05. ගෙවතු වගා කටයුතුවලදී බහුලව භාවිතයට ගනු ලබන උපකරණ ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. අත්මුල්ලුව, කප්පාදු කතුර හා උදැල්ල
    2. විල්බැරෝව, යතු කැටය හා අලවංගුව
    3. උදළු මුල්ලුව, කියත හා බද්ධ පිහිය
    4. අත් ඉස්කෝප්පය, අත් පෝරුව හා රේක්කය

06. බෝග වගාවෙන් ඉහළ අස්වනු ලබා ගැනීම සඳහා හඳුන්වා දුන් උපාය මාර්ග කිහිපයක් පහත දැක්වේ.
    A. - රසායනික පොහොර භාවිතය
    B. - රසායනික පලිබෝධනාශක භාවිතය
    C. - කෘෂි යන්ත්‍ර හා උපකරණ භාවිතය
    D. - නව බෝග ප්‍රභේද ගොවියාට හඳුන්වා දීම

    මේ අතුරින් මිනිසාට හා පරිසරයට හානිකර ලෙස බලපාන ප්‍රධාන උපාය මාර්ගය වන්නේ,
    1. A ය.
    2. B ය.
    3. C ය.
    4. D ය.

07. බෝග වගාවේදී කෘමි පලිබෝධ පාලනය සඳහා වගා කරනු ලබන ජෛව පාලන ශාක ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. රාබු හා මිරිස්
    2. තක්කාලි හා පැපොල්
    3. දාස්පෙතියා මල් හා කපුරු මල්
    4. ඉඟුරු හා කරවිල

08. විවිධ ප්‍රදේශවල පවතින දේශගුණික තත්ත්වය අනුව වගා කළ හැකි බෝග වර්ග සුවිශේෂ වේ. බස්නාහිර පළාතේ හොඳින් වැවෙන බෝග වර්ග කිහිපයක් වන්නේ,

1. අර්තාපල්, මැංගුස් හා අන්නාසි
2. පැපොල්, කුරක්කන් හා දූරියන්
3. මැංගුස්ටීන්, රඹුටන් හා අන්නාසි
4. දිවුල්, ඇපල් හා කෙසෙල්

09. කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සඳහා අවශ්‍ය ණය මුදලක් ලබා ගැනීමට යා යුතු වන්නේ,

1. රාජ්‍ය / පෞද්ගලික බැංකු හෝ මූල්‍ය සමාගමකට ය.
2. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ය.
3. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට ය.
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ය.

10. දේශීය වෙළඳ පොළ ඉලක්ක කරගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කරන්නේ නම් ලබා ගත යුතු ප්‍රමිති සහතිකය වන්නේ,

1. SPC ය.
2. SLS ය.
3. ISO ය.
4. GPS ය.

11. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය ලේඛන හා සේවක වැටුප් ආදිය සැකසීමට බහුලව යොදා ගනු ලබන පරිගණක මෘදුකාංගය වන්නේ,

1. MS Word ය.
2. MS Power Point ය.
3. MS Excel ය.
4. MS Project ය.

12. ආහාර විවිධාංගීකරණයේදී නැවුම් කිරි යොදාගෙන නිෂ්පාදනය කරන ද්‍රව්‍යයක් නොවන්නේ,

1. යෝගට් ය.
2. කිරිටොෆි ය.
3. අයිස්ක්‍රීම් ය.
4. කේක් ය.

13. ආහාර ඇසුරුම් කිරීම සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

A - ආහාර කල් ඉකුත්වීමේ දිනය
B - ආහාරය නිෂ්පාදකයා පිළිබඳ තොරතුරු
C - අන්තර්ගත ආහාර ප්‍රමාණය හා මිල

ඉහත තොරතුරු අතුරින් ආහාර ඇසුරුමක අනිවාර්යෙන්ම සඳහන් කළයුතු තොරතුර වන්නේ,

1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. A, B හා C යන සියල්ලම ය.

14. උපකරණයක චලනය වන කොටස් සහිත ස්ථානවලට ස්නේහක ද්‍රව්‍ය යොදනු ලබන්නේ,

1. ඝර්ෂණය වළක්වා ගැනීම සඳහා ය.
2. වේගය අඩු කිරීම සඳහා ය.
3. වේගය වැඩි කිරීම සඳහාය.
4. චලනය වන දිශාව වෙනස් කිරීම සඳහා ය.

15. පහත දැක්වෙන විදුලි පහන් අතරින්, උපදවන ආලෝක ප්‍රමාණය වඩා වැඩි තාප ප්‍රමාණයක් නිකුත් කරන විදුලි පහන් වර්ගය වන්නේ,

1. LED විදුලි පහන්ය.
2. සූත්‍රිකා විදුලි පහන්ය.
3. CFL විදුලි පහන්ය.
4. ම'කරි විදුලි පහන්ය.

16. අතීතයේ ශීතකරණවලට භාවිත කළ ද දැනට භාවිතය තහනම් කර ඇති, ඉහළ වායුගෝලයේ ඕසෝන් ස්ථරය හානි වීමට හේතු වන වායුව වර්ගය වන්නේ,

1. මීතේන් වායුවයි.
2. ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් වායුවයි.
3. කාබන්ඩයොක්සයිඩ් වායුවයි.
4. කාබන්මොනොක්සයිඩ් වායුවයි.

17. විවිධ ව්‍යාපාර සැලකූ විට කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

1. ග්‍රාමීය ප්‍රදේශවල පමණක් ව්‍යාප්තව තිබීම ය.
2. මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර භාවිත නො කිරීම ය.
3. පවුලේ ශ්‍රමයෙන් පමණක් පවත්වා ගෙන යාම ය.
4. අපනයනය සඳහා පමණක් භාණ්ඩ නිෂ්පාදනය කිරීම ය.

18. ව්‍යාපාර ලෝකය තුළ ව්‍යවසායකු ලෙස හඳුන්වනුයේ,
   1. කිසියම් ප්‍රතිලාභයක් ළඟාකර ගැනීමට මාර්ග උත්පාදනය කරන්නෙකි.
   2. විදේශීය භාණ්ඩ ආනයනය කර බෙදාහරින්නෙකි.
   3. වෙළඳ පොළ ගනුදෙනුවල දී උපදේශකයෙකු ලෙස කටයුතු කරන්නකි.
   4. අලෙවි ක්‍රියාදාමයේ දී තැරැව්කරුවකු ලෙස ක්‍රියාකරන්නකි.

19. ක්ෂුද්‍ර ජීවීන් මගින් ආහාර මත ක්‍රියාකර නිපදවන, ආහාර විෂ වීමට හේතු වන විෂ සංයෝගයකි,
   1. ජෙලටීන් ය   2. පෙක්ටීන්
   3. මොනෝසෝඩියම් ග්ලුකොමේට්   4. ඇෆ්ලටොක්සින්

20. ඉන්ද්‍රිය ගෝචරතාවය අනුව ආහාරයේ ගුණාත්මය මැනීමේදී ඒ සඳහා උපකාරී නොවන සාධකයක් වන්නේ,
   1. ආහාරයේ සුවඳ ය.   2. ආහාරයේ පැහැය ය.
   3. ආහාරය නිෂ්පාදිත ආයතනය ය.   4. ආහාරයේ රසය ය.

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. i) 9 ශ්‍රේණියේ සිසුන් විසින් කුඩා ව්‍යාපෘතියක් ලෙස පාසල් භූමියේ ගෙවත්තක් ආරම්භය කර පවත්වාගෙන යාමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
   ii) ගෙවත්ත සංවර්ධනය කිරීමේදී බෝග වගාවට අමතර ව එකතු කළ හැකි වෙනත් අංග හතරක් ලියන්න.
   iii) ගෙවත්තේ වගා කිරීම සඳහා බෝග වර්ග තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
   iv) පාසල් ගෙවත්තෙහි පාංශු ඛාදනය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රම තුනක් යෝජනා කරන්න.

02. i) කෘෂිකාර්මික කටයුතු නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න.
   ii) පරිසරයට සිදුවන අහිතකර බලපෑම් පාලනයට යොදාගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.
   iii) බෝගවලට හානි සිදුකරන කෘමි පලිබෝධ පාලනයට යොදා ගත හැකි පරිසර හිතකාමී ක්‍රම හතරක් නම් කරන්න.
   iv) කෘෂිකාර්මාන්තයේදී බාහිර පරිසරයට නිදහස් කරන අපද්‍රව්‍ය (ජෛව ස්කන්ධ) ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා තුනක් ලියන්න.

03. i) ආහාර විවිධාංගීකරණය යනු කුමක් ද?
   ii) ආහාර විවිධාංගිකරණය නිසා ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.
   iii) අමුද්‍රව්‍ය ලෙස කිරි යොදා ගනිමින් නිෂ්පාදනය කළ හැකි විවිධ නිෂ්පාදන හතරක් සඳහන් කරන්න.
   iv) ආහාර ද්‍රව්‍ය ඇසිරීම සඳහා ඇසුරුම් ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.

04. i) පහත දක්වා ඇති කාර්යයන් පහසු කර ගැනීම සඳහා නිෂ්පාදනය කර ඇති අදාළ උපකරණ / මෙවලම් දී ඇති කාර්යය ඉදිරියෙන් සඳහන් කරන්න.
      1. පොල් ගෑම -
      2. එළවළු කැබලි කර ගැනීම -
      3. මිරිස් හා තුනපහ කුඩු කර ගැනීම -
      4. ළිඳෙන් ජලය ලබා ගැනීම -
   ii) නිර්මාණයක් සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න.
   iii) කුඩා දරුවන් ඉලක්කකර ගනිමින් භාණ්ඩ නිෂ්පාදනයේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ඉදිරිපත් කරන්න.
   iv) නිවසේ පවතින විවිධ උපකරණවල කල් පැවැත්ම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

05. i) කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කර සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා බලපාන සාධක හතරක් සඳහන් කරන්න.

ii) කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා පවතින වාසිදායක අවස්ථා දෙකක් දක්වවින.

iii) සාර්ථක ව්‍යවසායකයෙකු සතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

iv) කුඩා පරිමාණ ව්‍යාපාරයකට අවශ්‍ය උපකාරක සේවා හතරක් ලියන්න.